# Restoration of old Photographs

# පැරණි ඡායාරූප සංරක්ෂණය කිරීම








අයෝමා ජයසිංහ

**අපගේ පැරණි හෝ මියගිය ඥාති මිත්‍රාදීන්ගේ හෝ වැදගත් පුද්ගලයින්ගේ ඡායාරූප නිවසේ ප්‍රදර්ශනය කොට තැබීම අප කාගේත් පුරුද්දකි. බොහෝවිට එම ඡායාරූප කළු/සුදු හෝ දුඹුරු පැහැයෙන් යුක්ත වන අතර වැඩි වශයෙන් ඒවා තරමක් හෝ සම්පූර්ණයෙන්ම විනාශ මුඛයට පත්ව ඇති බව පෙනී යන කරුණකි.**

එයට හේතුව 'Laminating' දිගු කලක් සුරක්ෂතව තබාගැනීමේ ක්‍රමවේදයන් එකල නොතිබීමයි. විශේෂයෙන්ම තෙතමනයට, හිරු-එළියට හා කාවුන් වැනි කෘමි සතුන් මගින් ඒවායේ ආයු කාලය අඩු කර ඇත. අපගේ මුතුන් මිත්තන් පෙනී සිටි මෙවැනි ඡායාරූප නැවතත් යථා තත්ත්වයට පත්කොට තවදුරටත් අනාගත පරපුර සඳහා සුරක්ෂිත කොට තැබීම අපගේ යුතුකමක් වන්නේය.

පැරණි ඡායාරූප සංරක්ෂණය කළයුතු අනෙක් කරුණ වන්නේ, ඒවායේ මිල කළ නොහැකි කෞතුක වටිනාකමක් ගැබ්වී ඇති නිසාත් අනවශ්‍ය පැළුම් රේඛා නොමැතිව නරඹන්නාට එය රස විඳීමට හැකි නිසාත් ය.

සංරක්ෂණය කළ පසු කළු/සුදු හෝ දුඹුරු පැහැයෙන් ඒවා නැවත මුද්‍රණය කළ හැකි සේම, තම අභිමතය පරිදි අවශ්‍ය නම් ඒවා වර්ණ ගැන්වීමද කළ හැකිය. මෙම ලිපියෙන් අර්ධ වශයෙන් විනාශ වී ගිය පැරණි කළු/සුදු ඡායාරූප සංරක්ෂණය කරන ආකාරය විස්තර කෙරෙනු ඇත.

මෙවැනි පුළුදු වූ ඡායාරූප නැවත යථා තත්ත්වයට පත්කිරීමේ පැරණි රසායනාගාර ක්‍රමද නොතිබුණා නොවේ.

විශේෂ පාට පැන්සල් වර්ගයක් මගින් ඡායාරූපයේ පළුදු සියුම් ලෙස වර්ණ ගැන්වීම එක් ක්‍රමයකි. පළුදු වූ ඡායාරූපය නැවත ඡායාරූප ගතකොට එයින් නෙගටිව් පටලයක් සාදා පළුදු වූ ස්ථාන රසායනාගාරයේදීම සංරක්ෂණය කිරීම තවත් ක්‍රමයකි. මේ ක්‍රම දෙකම සාර්ථක ඒවා නොවේ.



එකල ඡායාරූප සඳහා දෘශ්‍ය ප්‍රයෝග (Visual Effects) දැමීමද රසායනාගාර තුළදීම සිදුවිය. අද සියල්ල වෙනස්වී ඇත. පරිගණකය ලොවට පැමිණීමත් සමග ඡායාරූප ක්ෂේත්‍රයද අද්විතීය දියුණුවකට පත්විය.

කැමරාවකින් ඡායාරූපයක් ගැනීමේ සිට, එහි මුද්‍රණය ඔබ අතට පත්වීම දක්වා වන සියළු ක්‍රියාකාරකම් Digitalතාක්ෂණයට නිපදවූ යන්ත්‍ර සූත්‍ර කීපයක් ඔස්සේ විනාඩි කීපයකදී සිදු වේ.

සරලව විස්තර කලොත් පටල පටියක් නොමැති ඩිජිටල් කැමරාවකින් ගත් ඡායාරූපය කෙළින්ම 'ඩිජිටල් මිනි ලැබ්' රසායනාගාරයක් වෙත යවා තත්පර කීපයකදී ඔබට මුද්‍රණය ලබා ගැනීමට අද වන විට හැකියාව ලැබී තිබේ. රසායනාගාරයට යැවීමට පෙර පරිගණකයට පිංතූරය යැවුණු විට අදාළ සංස්කරණ, සංරක්ෂණ හා දෘෂ්‍ය ප්‍රයෝග (Visual Effects) සියල්ලම පරිගණකය තුළදීම ඉටු කරවා ගත හැක.



එයට සමගාමීව ඡායාරූප සුරක්ෂිත කිරීමේ ක්‍රමද, පළුදු වූ ඡායාරූප සංරක්ෂණය කිරීමේ ක්‍රමද දියුණු වී තිබේ. 'Laminate' කිරීම සහ CD තැටිවලට ගබඩා කර තබාගෙන ඉදිරි කාලයකදී නැවත මුද්‍රණ පිටපත් ලබාගැනීම සුරක්ෂත කිරීමේ ක්‍රම දෙකකි.

පළුදු වූ ඡායාරූප නවීන ලෝකයේ දී සංරක්ෂණය කෙරෙන්නේ, පරිගණක අනුසාරයෙනි. විශේෂයෙන්ම Photoshop මෘදුකාංගය මගින්ය. ඡායාරූප හා ග්‍රැෆික් නිර්මාණ ක්ෂේත්‍රයේ සුවිශාල පෙරළියක් කළ Photoshop මෘදුකාංගය ඔබගේ පරිගණකයේ ස්ථාපිත කළ යුතුය. Photoshop 7 සංස්කරණය මේ සඳහා වඩාත් ගැලපේ.

මෙයට අමතරව ඉතා හොඳ තත්ත්වයේ Scanner යන්ත්‍රයක් ද ඔබට අවශ්‍ය වේ. (ඔබට Scanner යන්ත්‍රයක් නොමැති නම් එවැන්නක් ඇති ස්ථානයකින් ඔබට මෙම සේවාව ලබාගත හැකිය.)

Scanner යන්ත්‍රයේ Resolution එක (Optical Resolution නොවේ.) 1200 X 2400 හෝ ඊට වැඩි අනුපාතයක් ඇති එකක් තෝරා ගැනීමට සැලකිලිමත් වන්න.

**දැන් අපගේ කාර්යය ආරම්භ කරමු**

පියවර 1

Scanner යන්ත්‍රයට ඔබගේ පැරණි පුළුදු වූ ඡායාරූප ;යාමුකරන්න. වර්ණ ක්‍රමය RGB ලෙස තෝරාගැනීම වඩාත් යෝග්‍ය වේ. පික්සල් තීව්‍රතාව (මෙහිදී Optical Resolution වැදගත් වේ.) 300 dpi ලෙස තෝරාගන්න. Passport වැනි කුඩා ප්‍රමාණයේ ඡායාරූපයක් Scan කරන විට 600 dpi හෝ 1200 dpi තෝරා ගැනීම වරදක් නැත. 10"X15" ප්‍රමාණයේ ඡායාරූපයක් සාමාන්‍යයෙන් Scan කරන්නේ 300 dpi ලෙස වුවත් සංරක්ෂණය සඳහා වඩා විස්තර (Details) ප්‍රමාණයක් පරිගණක තිරයට ලබාගත යුතු නිසා එය 600 dpi ලෙස Scan කරන්න.

පියවර 2

නියමිත ආකාරයෙන් ඡායාරූපය Scan කළ පසු නියමිත ෆයිල් ෆෝල්ඩරයක එය Save කරන්න.

පියවර 3

දැන් Photoshop 7 විවෘත කරන්න.Scan කරගත් නියමිත ඡායාරූපයද විවෘත කරගන්න. (1 රූපය) (ඡායාරූප සංරක්ෂණය කිරීම පුහුණුවන්නන් සඳහාPhotoshop මෘදුකාංගය තුළ පැරණි පළුදු වූ කළු/සුදු ඡායාරූපයක් අඩංගු කර ඇත. පුහුණුවීමට අවශ්‍ය අය කැමති නම් එය




එකල ඡායාරූප සඳහා දෘශ්‍ය ප්‍රයෝග (Visual Effects) දැමීමද රසායනාගාර තුළදීම සිදුවිය. අද සියල්ල වෙනස්වී ඇත. පරිගණකය ලොවට පැමිණීමත් සමග ඡායාරූප ක්ෂේත්‍රයද අද්විතීය දියුණුවකට පත්විය. කැමරාවකින් ඡායාරූපයක් ගැනීමේ සිට, එහි මුද්‍රණය ඔබ අතට පත්වීම දක්වා වන සියළු ක්‍රියාකාරකම් Digital තාක්ෂණයට නිපදවූ යන්ත්‍ර සූත්‍ර කීපයක් ඔස්සේ විනාඩි කීපයකදී සිදු වේ.

විවෘත කරවාගන්න. එය සොයාගත හැකි මාර්ගය වන්නේ

File► Open► C Programe Files► adobe ► Photoshop 7 ► Samples ► "Old image"

පියවර 4

අදළ කළු/සුදු ඡායාරූපයේ කළු පසුබිමේ, සුදු පැහැති පැල්ලමක් ඇතැයි සිතමු. (2 රූපය බලන්න)

එම පැල්ලමට අවටින් ඇති වර්ණයට සමාන වර්ණයකින් පැල්ලම මත වර්ණ ගැන්වීම අපගේ මූලික කාර්යයයි. හුදෙක් අවට ඇති වර්ණය පමණක් නොව අවට ඇති සියුම් වර්ණ රටා සහිත (Texture) වැස්මකින් මෙම පැල්ලම වැසුණොත් වඩා තාත්වික ප්‍රතිඵලයක් ලබාගත හැක.

මේ සඳහා Photoshop වල මෙවැනි කාර්යයක් කළ හැකි මෙවලම් 3 ක් අපට හමුවේ. Patch Brush / Healing Brush / Stamp Tool මේවා වේ. මෙයින් තමන්ට කැමති මෙවලමක් භාවිතා කළ හැකි මුත්, අප මෙහිදී විස්තර කරන්නේ, 'Healing Brush' මගින් පැල්ලමක් වසන ආකාරයයි.

පියවර 5

*තාක්ෂණික ක්‍රමය මෙසේ ය.*

අ - 'Healing Brush' Tool එකClick කරන්න. (තෝරා ගන්න) එය තෝරාගත් විගස තිරයේ ඉහළ 'Property Bar' එකේ,Healing Brush එකට අදාළ අගයන් වෙනස් කිරීමේ දත්ත දිස් වේ. Brush එකේ ප්‍රමාණය වෙනස් කිරීමට අවශ්‍යම නම්, මෙහි Brush වදන ඉදිරියෙන් දක්වෙන බොත්තමClick කිරීමෙන් පැනලයක් දියහැරේ. එහිBrush ප්‍රමාණය හා වෙනත් අගයන් අවශ්‍ය නම් වෙනස් කරගන්න. (3 රූපය)

ආ - දැන් ඔබ යම් Brush ප්‍රමාණයක් තෝරාගෙන ඇත. දැන් කර්සරය ඡායාරූප මතට ගෙනයන්න. කර්සරය කුඩා රවුමක් (වක්‍රයක්) ලෙස දර්ශනය වනු ඇත. ඒ Brush එකේ ප්‍රමාණයයි. එම ප්‍රමාණයට සමාන වූ යම් සුදු පැහැති පැල්ලමක් වෙතට කර්සරය ගෙන යන්න. කර්සරය පැල්ලම මත නොතබා එයට ඉතා ආසන්නයෙන් කළු පසුබිම මත රඳවා තබා ගන්න. (4 රූපය)




ඇ - දැන් Keyboard එකේ 'Alt' බොත්තම වම් අතින් Press කරගෙනම තබාගන්න. එවිට මෙතෙක් රවුමට දිස්වූ කර්සරය වෙනත් හැඩයක් ගනු ඔබට පෙනේ. දැන් මවුසය Click කරන්න. (මෙම අවස්ථාවේ කර්සරය පැල්ලමට ආසන්නව කළු පසුබිම මත ඇති බවට වගබලාගන්න) ඉන් පසුයි Keyboard එකේ Alt බොත්තමRelease (නිදහස්) කළ යුත්තේ.

ඇ - දැන් ප්‍රවේශමෙන් පැල්,ම වැසියන පරිදි පැල්ලම මත කර්සරය (රවුම් හැඩය) රඳවා තබාගෙන (5 රූපය බලන්න) තව එක සැරයක් මවුසයClick කරන්න. එවිට විශ්මිත ලෙස පැල්ලම අන්තර්දාන වී යයි. මෙයයි මෙහි මූලික තාක්ෂණය.




සියල්ලටම වඩා වැදගත් වන්නේ, පළුදු වූ ප්‍රදේශයට ගැලපෙන යැයි සිතෙන එයට ආසන්නම වූ ප්‍රදේශයක් Alt මගින් තෝරාදීමයි.

ඇත්ත වශයෙන් මෙහිදී සිදුවන්නේ පැල්මට එපිටින් ඇති කුඩා කොටසක් පරිගණකය මගින් පිටපත් කරගෙන එහි කොපියක් පැල්ලම මත ඇලවීමයි. හරියට අපගේ ශරීරයේ තුවාලයක් ඇති තැනක් ඒ අවට ඇති හම කොටසක පිටපතක් ගෙන තුවාලය වසා දැමීමක් හා සමාන ක්‍රියාවලියකි. එවිට හම පමණක් නොව හමෙහි වූ රෝම කූප, සෛල හා වර්ණ ද අලුත් හම කොටසට යන නිසා, කුවාලයක් තිබුණාදැයි සොයාගත නොහැක.

**ඇත්ත වශයෙන් මෙහිදී සිදුවන්නේ පැල්මට එපිටින් ඇති කුඩා කොටසක් පරිගණකය මගින් පිටපත් කරගෙන එහි කොපියක් පැල්ලම මත ඇලවීමයි. හරියට අපගේ ශරීරයේ තුවාලයක් ඇති තැනක් ඒ අවට ඇති හම කොටසක පිටපතක් ගෙන තුවාලය වසා දැමීමක් හා සමාන ක්‍රියාවලියකි. එවිට හම පමණක් නොව හමෙහි වූ රෝම කූප, සෛල හා වර්ණ ද අලුත් හම කොටසට යන නිසා, කුවාලයක් තිබුණාදැයි සොයාගත නොහැක.**

ඡායාරූපයක පසුබිම මත පමණක් නොවේ පුද්ගලයෙකුගේ මුහුණ මත, ඇඳුමක් මත ඇති පළුදු වූ ස්ථාන පවා මේ ආකාරයට වසා දැමිය හැකිය.

මේ ආකාරයට මෙවැනි පෞරාණික දුර්වර්ණ වූ ඡායාරූප සංරක්ෂණය කළ හැකි අතර, ඒවා නැවත පරිගණකයේ 'Save' කිරීමේදී වර්ණ ක්‍රමය RGB ලෙසද, File Format එකJPEG ලෙසද තෝරාගන්න.

අපගේ ජාතික පුස්තකාල සහ ලේඛනාගාර වැනි ආයතනවල දැනටමත් විනාශවෙමින් පවතින වටිනා පැරණි ඡායාරූප මෙම ක්‍රමයට පහසුවෙන් සංරක්ෂණය කළ හැක.

ෆලොපි හෝ CD තැටියකට ඔබගේ සංරක්ෂිත ඡායාරූපය බහා Digital Mini Lab ආයතනයක් වෙත ගොස් මුද්‍රණය ලබාගන්න.

මේ ආකාරයට කළු/සුදු ඡායාරූප පමණක් නොව පළුදු වූ වර්ණ ඡායාරූප පවා සංරක්ෂණය කළ හැක.

සම්පූර්ණයෙන්ම කළු/සුද් ඡායාරූපයක් දර්ශනීය වෛවර්ණ ඡායාරූපයක් බවට පත්කිරීමේ පරිගණක තාක්ෂණය ලබන කලාපයෙන් හඳුන්වා දෙමු. ■